Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-04-28 |

පැමිණිලිකාරිය : එච්.කේ. මැදවල මිය.
අංක : 213, පල්ලේගුන්නැපාන,
පොල්ගොල්ල.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
මහ/ මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ජාතික පාසැල් අධ්‍යක්ෂ,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

04. නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මහනුවර.

<u>පැමිණිලි අංකය : **HRC/K/258/15**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ල කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් දක්වා ඇත්තේ, තම දියණිය 2015 වසරේදී මහනුවර මහමායා බාලිකා විද්‍යාලයට ඇතුළත් කිරීමේ අරමුණින් ආදිශිෂ්‍ය පදනම මත අයදුම්පත් යොමු කළ බවත්, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ලකුණු 46ක් උපයාගත් බවත්ය. 2003 සහ 2004 වසරේදී තමා පාසලේ බෞද්ධ ශිෂ්‍ය සංගමයේ උප සභාපති ධූරය ඉසුලූ බවත් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුව තමාට ඒ සඳහා ලකුණු 2ක් ලැබිය යුතු නමුත් තමාට එක් ලකුණක් පමණක් ඒ සඳහා ලබාදී ඇති බවත් එසේම තමා ආදිශිෂ්‍ය සංගමය වෙනුවෙන් ලබාදී ඇති ශ්‍රමදායකත්වයන් සඳහා සම්පූර්ණ ලකුණු 2ක් හිමිවිය

යුතු වුවත් ඒ සඳහාද තමාට එක් ලකුණක් ලැබුනු බවත් දක්වා ඇත. ඉහත හේතූන් මත තමාට ලැබිය යුතු නිවැරදි ලකුණු 2ක් අහිමි වී ඇති බව දක්වා ඇත. එසේම තමාට වඩා අඩු සුදුසුකම් පවතින ඇතැම් අයදුම්කරුවන්ගේ දරුවන් ආදිශිෂ්‍ය පදනම යටතේ මේ වනවිට පාසලට ඇතුලත් කර ගෙන ඇති බවත් එකී වරදකාරී තෝරාගැනීම හේතුවෙන් මේ වනවිට පොරොත්තු ලේඛනයේ 1 ස්ථානයේ පසුවන තමාගේ දරුවා තෝරාගැනීමට බාධා පැමිණ ඇති බවත් ඒ අනුව ඉහත සියලු කරුණු මත තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් මෙම පැමිණිල්ල මගින් සඳහන් කර ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටින ලද වගඋත්තරකාර පාර්ශවයන් සිය ලිඛිත හා වාචික දේශන කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් දන්වා ඇත්තේ, පැමිණිලිකාරිය ආදිශිෂ්‍ය පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 46ක් පමණක් උපයා ඇති බවත් ආදිශිෂ්‍ය ගණය යටතේ පාසලට ඇතුලත් කොට ගත් අවම ලකුණු සීමාව 47ක් වන බවත් ඒ අනුව අවම ලකුණු සීමාව උපයා නොගැනීම මත පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුලත් කොට ගෙන නොමැති බවත්ය. කෙසේ වෙතත් මේ වනවිට පැමිණිලිකාරිය පොරොත්තු ලේඛනයේ 1 වන ස්ථානයේ සිටින බව වැඩිදුරටත් දක්වා ඇත.

තවද පැමිණිලිකාරිය 2003/2004 වසරවලදී පාසලේ බෞද්ධ ශිෂ්‍ය සංගමයේ උපසභාපති ධූරය උසුලා ඇති බව සත්‍යක් වුවද ඒ බව තහවුරු කිරීම සඳහා පිළිගත හැකි ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පැමිණිලිකාරිය අපොහොසත් වී ඇති බවත්, ඒ අනුව ඇයට සම්පූර්ණ ලකුණු ලබා නොදීමට තීරණය කළ බවත් දක්වා ඇත. එසේම ආදිශිෂ්‍ය සංගමය වෙනුවෙන් පාසලට ශ්‍රමදායකත්වය ලබාදීමේදී සම්පූර්ණ ශ්‍රමදායකත්වය අවස්ථා 10ක් සඳහා ලකුණු 2ක් ලබාදීමට තීරණය කළ බවත් නමුත් පැමිණිලිකාරිය ඉදිරිපත් කොට ඇති ලේඛන අනුව ශ්‍රමදායකත්ව 6ක් පමණක් ලබාදී ඇති බව අනාවරණය වී ඇති බවත් ඒ අනුව එක් ලකුණක් පමණක් ලබාදී ඇති බවත් දන්වා ඇත. ඒ අනුව නිවැරදි ලේඛන ඉදිරිපත් නොකිරීම මත ඉහත අවස්ථා දෙක සඳහාම සම්පූර්ණ ලකුණු උපයා ගැනීමට පැමිණිලිකාරිය අපොහොසත් වී ඇති බවත් නිවැරදි ලේඛන ඉදිරිපත් කළේ නම් ඇයට තවත් අමතර ලකුණු 02 ක් ලබාගැනීමේ නෛතික හැකියාව පවතින බවත් වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාව හමුවේ පිළිගෙන ඇත.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-

දෙපාර්ශවය විසින්ම කොමිෂන් සභාව හමුවේ ලිඛිතව හා වාචිකව ඉදිරිපත් කර ඇති ඉහත සියලු කරුණු සලකා බැලීමෙන් පසු පහත කරුණු අනාවරණය වී ඇත.

එනම් පැමිණිලිකාරිය ආදිශිෂ්‍ය පදනම යටතේ සහභාගි වී ලකුණු 46ක් උපයාගෙන ඇති බවත් ආදිශිෂ්‍ය පදනම යටතේ පාසලට ඇතුලත් කොටගෙන ඇති අවම ලකුණු සීමාව 47 බව අනාවරණය වී ඇත. මුල් අවස්ථාවේදී පැමිණිලිකාරිය 3වන ස්ථානයේ ස්ථානගත වී ඇති අතර මේ වනවිට ඉහලින් සිටින ලද දරුවන් පාසලට ඇතුලත් කොට ගැනීම හේතුවෙන් පැමිණිලිකාරිය 1 වන ස්ථානයේ ස්ථානගතව ඇති බවද නිරීක්ෂණය වේ. එසේම මේ වනවිට පැමිණිලිකාරිය හා සම ලකුණු ලබා ඇති අනෙක් දරුවාද පාසලට ඇතුලත් කොටගෙන ඇති බවත් පැමිණිලිකාරියගේ දරුවා පමණක් සම ලකුණු ලබා පොරොත්තු ලේඛනයේ තවදුරටත් රඳවා තබා ඇති බවත් අනාවරණය වී ඇත.

පැමිණිලිකාරිය බෞද්ධ ශිෂ්‍ය සංගමයේ උපසභාපති ධුරය දැරුවා ද යන්න ගැඹුරින් සලකා බැලීමේදී ඇය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට තහවුරු කිරීමට කිසිදු ලේඛනයක් ඉදිරිපත් කොට ඇද්ද හෝ නැද්ද යන්න විමර්ශනයට ලක්කර ඇත. දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට අනුව තමා බෞද්ධ ශිෂ්‍ය සංගමයේ උපසභාපති ධුරය උසුලූ බව තහවුරු කිරීම සඳහා පැමිණිලිකාරිය එවකට බෞද්ධ ශිෂ්‍ය සංගමයේ සිටි අනුශාසක ගුරුතුමිය විසින් අත්සන් තබන ලද හා පසුව හිටපු නියෝජ්‍ය විදුහල්පතිනිය ඩී.එම්.ඒ.එල් දිසානායක මහත්මිය විසින් සහතික කරන ලද 2014.05.05 දින දරණ ලිපියක් පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කොට ඇති බව නිරීක්ෂණය වේ. එකී ලේඛනයට අනුව ඇය 2003/2004 කාලය තුළ අ.පො.ස. (උ.පෙළ) කලා අංශයේ බී ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර බෞද්ධ ශිෂ්‍ය සංගමයේ උප සභාපති ධුරය දරා ඇති බව අනාවරණය වී ඇත. මෙම ලේඛන ලිපි ශීර්ෂ ලේඛනයක සටහන් කොට නොමැති ලේඛනයක් වුවද එවකට බෞද්ධ ශිෂ්‍ය සංගමයේ අනුශාසකතුමිය හා නියෝජ්‍ය විදුහපතිතුමිය අත්සන් කර තහවුරු කිරීමක් කර ඇති බව අනාවරණය වේ. මෙම ලේඛනය සාවද්‍ය ලේඛනයක් ලෙස වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාව හමුවේ කිසිදු අවස්ථාවක කරුණු දක්වා නොමැති අතර ඉදිරිපත් කොට ඇති එකම කරුණ වන්නේ මෙම කාරණය පිළිගත හැකි ලෙස තහවුරු කර නොමැති බව පමණි. පිළිගත හැකි ක්‍රමවේදය කුමක්ද යන්න තහවුරු කිරීමට වගඋත්තරකාර මහමායා බාලිකා විද්‍යාලය කොමිෂන් සභාව හමුවේ අපොහොසත් වී ඇත.

යම්කිසි ශිෂ්‍යාවක විසින් මෙවැනි සුදුසුකමක් පිළිබඳව ලිඛිත තහවුරු කිරීමක් ඉල්ලා සිටින අවස්ථාවකදී මහාමායා බාලිකා විද්‍යාල විසින් එකී සුදුසුකම් තහවුරු කිරීම කුමන ආකාරයකින් සිදු කරන්නේද යන්න නිශ්චිත තහවුරු කොට ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. විශේෂයෙන්ම පැරණි සුදුසුකම් පිළිබඳව එනම් 2003/2004 වර්ෂයේදී යම් ආදි ශිෂ්‍යාවක විසින් පාසලේ දරණ ලද තනතුරක් හෝ වෙනයම් සුදුසුකමක් සම්බන්ධයෙන් වර්තමානයේ එකී සුදුසුකම් තහවුරු කරමින් ලේඛන නිකුත් කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් පාසලේ ක්‍රියාත්මක නොවන බව පැහැදිලිවම කොමිෂන් සභාව හමුවේ දක්වා ඇත. ඒ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය දන්වා ඇත්තේ එවැනි යම් සුදුසුකමක් හෝ තනතුරක් යම් ශිෂ්‍යාවක විසින් තම පාසල්

කාලය තුළ දරා ඇත්නම් ඇය පාසල හැර යන අවස්ථාවේදි එකී සුදුසුකම් තහවුරු කොට ගැනීම සිදු කළ යුතු බවයි. එසේම තමා පැරණි කාලයේ දැරූ තනතුරු සම්බන්ධයෙන් යම් ශිෂ්‍යාවක් වර්තමානයේදි සහතික කිරීමේ ලේඛනයක් ඉල්ලා සිටියහොත් එවැනි ලේඛනයක් වර්තමාන විදුහල්පතිනිය විසින් හෝ වෙනයම් වගකිවයුතු ගුරුභවතකු විසින් අත්සන් කොට ලබා නොදෙන බව වැඩිදුරටත් දන්වා ඇත.

ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදි පැමිණිලිකාරිය පාසල යන හැර යන අවස්ථාවේදි තමා බෞද්ධ ශිෂ්‍ය සංගමයේ උපසභාපති ධුරය දැරූ බව විදුල්පතිනිය ඇතුලු පරිපාලනය මගින් සහතික කොට ගැනීමක් සිදු කොට ගෙන නොමැත. නමුත් ඇයගේ දරුවා පාසලට ඇතුලත් කොට ගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් 2014 වසරේදි ඇය 2003/ 2004 වසරයන්හිදි බෞද්ධ ශිෂ්‍ය සංගමයේ දැරූ තනතුරක් තහවුරු කොට ගැනීම පරිපාලනය මගින් අපේක්ෂා කොට ඇති අතර දැනට සේවයේ නියුතු නිලධාරින්ගෙන් එවකට සේවයේ සිටි නිලධාරින් මගින් තහවුරු කර ගැනීම සිදු කළයුතු බවට වාචික උපදෙස් ලැබීම මත ඇය එවකට සිටි උපදේශක සහ නියෝජ්‍ය විදුහල්පතිනිය මගින් සහතික කොට අදාළ ලේඛනය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කොට ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය ප්‍රශ්නගත තනතුර නොදැරුවාය යන තර්කය කිසිදු අවස්ථාවකදි මතු නොකරන මහමායා විද්‍යාලය එය තහවුරු කිරීමට ඉදිරිපත් කර ඇති ලේඛනය පමණක් පිළිගත නොහැකි බව දන්වා ඇත. එනම් පැහැදිලිවම මහමායා විද්‍යාලයේ 2003/2004 වසරේදි බෞද්ධ ශිෂ්‍ය සංගමයේ උපසභාපති ධුරට දැරූ බව වගඋත්තරකාර පාර්ශවය පිළිගන්නා බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇත.

යම් අයදුම්කාරියක් විසින් විශේෂයෙන් ආදිශිෂ්‍යාවක විසින් පාසලට සම්බන්ධ කාරණයක් ඉදිරිපත් කොට සිටින අවස්ථාවක එකී කාරණය ව්‍යාජ කාරණයක් හෝ අසත්‍ය කාරණයක් ලෙස බැලූ බැල්මට නොපෙනේ නම් එකී කාරණය තහවුරු කොට ගැනීමේ සියලු නෛතික හැකියාවන් පවතින්නේ පාසල වෙත පමණක් නම් එනම්, අදාළ සියලූ ලේඛන සහ අදාළ නිලධාරින් අන්තර්ගත වන්නේ මහමායා විද්‍යාලය තුළම නම් ඒ සම්බන්ධයෙන් වඩාත් නම්‍යශීලි පිළිවෙතක් අනුගමනය කිරීමේ වගකීම පැවරී ඇත්තේද මහමායා විද්‍යාලයේ පරිපාලනය වෙත වන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ. වඩාත් මානුෂීය පදනමක් යටතේ ක්‍රියා කළේ නම් ආදිශිෂ්‍යාව විසින් ඉදිරිපත් කරනු ලබන හා විශ්‍රාමික වුවද වගකිව යුතු නිලධාරින් විසින් අත්සන් කොට ඇති ලේඛනයක් එකහෙලාම පිළිගත නොහැකි ලේඛනයක් ලෙස බැහැර කරනවාට වඩා එකී ලේඛනයේ නිරවද්‍යතාවය තහවුරු කොට ගැනීමට කිසියම් උත්සහයක් හෝ මහමායා විද්‍යාලය දැරුවේ නම් එය කිසියම් නිවැරදි හා සාධාරණ වූ ක්‍රියාවක් ලෙස අර්ථකතනය කළ හැකිය.

එසේම කොමිෂන් සභාව හමුවේ මතුවන ලද මීළඟ ප්‍රධාන කාරණය වන්නේ පැමිණිලිකාරිය ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් පාසලට ලබාදී ඇති ශ්‍රම දායකත්වයන් සඳහා හිමිවිය යුතු ලකුණු 2 ලබා ගැනීමට ඇය අපොහොසත් වී ඇද්ද යන්නයි.

අදාළ ලකුණු ලේඛනය පරීක්ෂා කොට බැලීමේදී පාසලට ලබාදී ඇති ශ්‍රමදායකත්ව 10ක් සඳහා ලකුණු 2ක් ලබාදී ඇති අතර එකී ශ්‍රමදායකත්ව 10 තහවුරු කිරීම සඳහා විදුල්පතිතිය විසින් අත්සන් කරන ලද ලේඛනයන් ඉදිරිපත් කළයුතුව ඇත. පැමිණිලිකාරිය එවැනි අවස්ථා 6ක් පමණක් සහතික කරමින් මුල් අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලේඛන ඉදිරිපත් කොට ඇති අතර එක් ලකුණක් පමණක් එකී ලේඛනයට ලබාදී අති බව නිරීක්ෂණය වේ. නමුත් කොමිෂන් සභාවට අනාවරණය වන ලද සුවිශේෂී කාරණය වන්නේ පැමිණිලිකාරිය සතුව සම්පූර්ණ අවස්ථා 10ක් සඳහා විදුහල්පතිතිය සහතික කරන ලද ලේඛන පැවතීමයි. නිරීක්ෂණය වන ලද කරුණු වලට අනුව සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ අවස්ථා 6ට අමතරව තවත් අවස්ථා 4කදී පැමිණිලිකාරිය ශ්‍රමදායකත්වය සපයා දී ඇති බව විදුහල්පතිතිය සහතික කොට ඇත. නමුත් එය මුල් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී තහවුරු වී නොමැත. ඒ අනුව ඒ සඳහා ලකුණු ලබාදීමේ නෛතික හැකියාවක් නොපවතින අතර ඒ සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිවැරදිව ක්‍රියා කොට ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් අභියාචනා මණ්ඩලයට එකී ලේඛන ඉදිරිපත් කිරීමේදී එකී ලේඛන සලකා බැලීමක් සිදු කොට නොමැති බවද නිරීක්ෂණය වේ.

මීළඟ සුවිශේෂී කාරණය වන්නේ පැමිණිලිකාරියට වඩා අඩු සුදුසුකම් සපුරා ඇති වෙනත් අයදුම්කරුවන්ගේ දරුවන් පාසලට ඇතුලත් කොට ගෙන ඇද්ද යන කාරණයයි. එහිදී ආදිශිෂ්‍ය පදනම යටතේ පාසලට තෝරා ගෙන ඇති අවසාන ලේඛනයේ අංක 40 යටතේ වන එම්.ඩී.ඕ.ඩී. ආරියවංශ යන අයගේ දරුවා පාසලට තෝරාගෙන ඇත්තේ කුමන පදනමින් ද යන්න කොමිෂන් සභාව හමුවේ ගැඹුරින් සාකච්ජා කර ඇත.

ඒ සම්බන්ධයෙන් මහාමායා බාලිකා විද්‍යාලය වෙනුවෙන් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත්තේ එම අයදුම්කාරියගේ සහෝදරිය මහාමායා බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක් වන බවත්, ඒ සඳහා එක් ලකුණක් උපයා ගැනීමේ හැකියාව පවතින බවත්ය. නමුත් එකී අයදුම්කාරිය තම සහෝදරිය මහාමායා බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක බව තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් මුල් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හමුවට ඉදිරිපත් නොකළ බවත් වාචිකව පමණක් කරුණු දැක්වූ බවත් නමුත් අභියාචනා පරීක්ෂණ මණ්ඩලයේදී ඒ බව තහවුරු කිරීම සඳහා තම සහෝදරියගේ උප්පැන්න සහතිකය අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කළ බවත් ඒ හේතුවෙන් ඇයට ලකුණක් ලබාදී ඇති බවත් ඒ අනුව ඇය අවසාන ලේඛනයේ 40 වන ස්ථානයට සුදුසුකම් ලත් අයෙකු ලෙස තෝරා ගෙන ඇති බවත් දක්වා ඇත. මේ බව ප්‍රකාශිතවම වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාව හමුවේ පිළිගෙන ඇත.

මෙම කාරණය හා සලකා බැලීමේදී පැහැදිලිවම අභියාචන මණ්ඩලය චක්‍රලේඛන ප්‍රතිපාදනයන්ට පරිබාහිරව නීතිවිරෝධී ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වේ. එනම් චක්‍රලේඛය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් නොකළ නව ලේඛනයක් අභියාචනා පරීක්ෂණයේදී භාරගැනීමක් හෝ සලකා බැලීමක් කළ නොහැකිය. නමුත් මහමායා විද්‍යාලයේ අභියාචනා පරීක්ෂණ මණ්ඩලයේ ප්‍රශ්නගත අයදුම්කාරියගේ සහෝදරිය පාසලේ ආදිශිෂ්‍යාවක බව තහවුරු කර ගැනීම සඳහා ඇයගේ උප්පැන්න සහතිකය භාරගෙන සලකා බලා ලකුණු ලබාදීමක් සිදු කොට ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැහැදිලිවම එකී තෝරා ගැනීම නීති විරෝධී තෝරාගැනීමක් ලෙස අනාවරණය වේ. ඒ අනුව මෙකී ප්‍රශ්න ගත තෝරා ගැනීම සිදු නොකලා නම් අයදුම්කරුවන් ස්ථානගත කිරීමේ අවසාන ලේඛනයට අනුව පොරොත්තු ලේඛනයේ මේ වනවිට 1 ස්ථානයේ පසුවන පැමිණිලිකාරිය සුදුසුකම් ලත් අයෙකු ලෙස ඇයගේ දරුවා මේ වනවිටත් පාසලට ඇතුලත් වීමේ හැකියාව පැවත ඇති බව තහවුරු වී ඇත.

එසේම පැමිණිලිකාරිය සතු ශ්‍රමදායකත්වය තහවුරු කිරීමේ ලේඛන චක්‍රලේඛනය ප්‍රකාරව භාරගෙන පරීක්ෂා කොට ලකුණු ලබා දීමට ක්‍රියා නොකරන අභියාචන පරීක්ෂණ මණ්ඩලය වෙනත් අයදුම්කාරියකගේ නව ලේඛනයක් සලකා බලා පවතින නෛතික ප්‍රතිපාදනයන්ට පරිබාහිරව ක්‍රියා කරමින් නීතිය සර්ව සාධාරණව ක්‍රියාත්මක නොකරමින් වෙනස් කොට සැලකීමක් සිදු කොට ඇති බව නිරීක්ෂණය වේ. ඒ හේතුවෙන් පැමිණිලිකාරියට හිමිවිය යුතු ප්‍රමුඛත්ව ලේඛනයේ ස්ථානය ඇයට අහිමි කොට ඇත.

**නිගමනය :-**

ඒ අනුව පාර්ශවයන් ඉදිරිපත් කොට ඇති ඉහත සියලුම ලිඛිත හා වාචික කරුණු සලකා බැලීමෙන් පසු කොමිෂන් සභාව විසින් පහත නිගමන වලට එළඹෙන ලදි. එනම්,

මහාමායා බාලිකා විද්‍යාලය තුළ පවතින ක්‍රමවේදය තුළ ආදි ශිෂ්‍යවකට තමා අධ්‍යාපනය හදාරමින් සිටි කාලය තුළ තමා විසින් දරන ලද තනතුරක් හෝ සුදුසුකමක් සම්බන්ධයෙන් වර්තමානයේ සහතිකයක් ලබා ගැනීමේ ක්‍රම වේදයක් පවතින බව අනාවරණය වී නොමැත. ඒ හේතුවෙන් පැමිණිලිකාරිය ප්‍රශ්නගත සම්මුඛ පරීක්ෂණයේදී හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය හමුවේ දැඩි අසීරුතාවයකට මුහුණ පා ඇති බව අනාවරණය වී ඇත.

අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් චක්‍රලේඛනය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ඉදිරිපත් නොකළ නව ලේඛන ඇතැම් අයදුම්කරුවන් සම්බන්ධයෙන් පමණක් සලකා බලා ඇති අතර පැමිණිලිකාරිය ඇතුළු තවත් කොටසකගේ එසේ සලකා බලා නොමැති බවද අනාවරණය වී ඇත. මෙය නීතිය සර්ව සාධාරණ ක්‍රියාත්මක නොකරන හා සමානුපාතිකව නොසලකා ඇති

බව තහතවුරු වන ක්‍රියාවකි. මෙකී නිත්‍යානුකූල නොවන ක්‍රියාව හේතුවෙන් ප්‍රමුඛතා ලේඛනයේ ඉදිරියෙන් පෙලගැසි ඇති පැමිණිලිකාරියට සෘජුවම එකී ක්‍රියාවේ බලපෑම හේතුවෙන් අසාධාරණයක් සිදුවී ඇති බව අනාවරණය වී ඇත.

එසේම එකම ක්‍රියාවලියක් සියලු අයදුම්කරුවන් වෙත ක්‍රියාත්මක කලේ නම් හා එකී ක්‍රියාව පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක කලේ නම් අභියාචනා පරීක්ෂණ මණ්ඩලය පැමිණිලිකාරිය විසින් ශ්‍රම දායකත්වය සපයා ඇති බව තහවුරු කෙරෙන ලේඛන ද සලකා බලා තවත් ලකුණක් උපයා ගැනීමේ හැකියාව ඇය සතු වන බව තහවුරු වී ඇත.

එසේම මේ වනවිට අසාත්තනා පදනම මත පෙරොත්තු ලේඛනයේ සම ලකුණු ලබා ස්ථානගත වී සිටින ලද සියලුම දරුවන් අධිකරණ තීරණයක් මත පාසලට ඇතුලත් කොට ගෙන ඇති බවට කරුණු ඉදිරිපත්ව ඇත. එකී කාරණය හා සමගාමීව ක්‍රියා කරමින් පැමිණිලිකාරියද තමන්ට සිදුවී ඇති අසාධාරණ සම්බන්ධයෙන් නීතියේ රැකවරණය මත අධිකරණ ක්‍රියාදාමයකට එළඹ ඇති තැනැත්තියක හා ආදි ශිෂ්‍ය පදනම යටතේ සම ලකුණු ලබා ඇති අනෙක් දරුවා මේ වනවිටත් පාසලට ඇතුලත් කොටගෙන තිබීම හා පැමිණිලිකාරියගේ දරුවා පමණක් දැනට පොරොත්තු ලේඛනයේ ඉතිරිවූ සමලකුණු ලැබූ එකම දරුවා ලෙස සලකා බලා ඇයට වාසිසහගත තීරණයක් ගැනීම කිසියම් යුක්ති සහගත ක්‍රියාවක් ලෙස නිරීක්ෂණය වී ඇත.

එම නිසා ඉහත සියලු කරුණු සලකා බලා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් සිදු කොට ඇති යම් අකාර්යක්ෂමව නීතිය සර්වසාධාරණව ක්‍රියාත්මක නොකිරීමත් හා අසමානව සැලකීම තුලින් පැමිණිලිකාරිය ලකුණු උපයා ගැනීමේ හැකියාව අහිමි වී ඇති බවත්. ඇතැම් අයදුම්කරුවන්ට පමණක් සුවිශේෂීව සලකා ඇති බව අනාවරණය වීමත් මත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් ක්‍රියා කොට ඇති බවට නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

> පැමිණිලිකාරියගේ දරුවා වගඋත්තරකාර විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.05.27 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

Udagama
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- 01 ලේකම්.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

02 මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය.
මහනුවර.

B/..